ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013
ක්‍රි. ව. 2013 ජූලි 29 සඳුදා
05 වෙළුම - 38 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු. 10.00

# ළමා ප්‍රදීපය

# 5

## වසර පහක
## අභිමානවත් වෙනසක්....

නව පාසල් වාරයේදී 'ළමා ප්‍රදීපය' අළුත්වෙනවා...

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# "ළමා ප්‍රදීපය" අලුත් වෙනවා.

## ආදරණීය දුවේ පුතේ...

අපි ඔබට කලින්ම මතක් කළ ආකාරයට ''ළමා ප්‍රදීපය'' අලුත් වෙන්නයි යන්නේ. මේ සතියෙ කලාපය මුද්‍රණය වූවාට පසුව ඉදිරි සති දෙකක කාල පරාසයක් තුළ ''ළමා ප්‍රදීපය'' ''ඥනාර්ථ ප්‍රදීපය'' පුවත් පතින් දැක ගන්නට පුළුවන්. හැබැයි ඒ සති දෙක තුළ ''ළමා ප්‍රදීපය'' අලුත් විය යුත්තේ කෙසේද කියලා ඔබ පුරවා එවූ මත විමසුම අනුව අපිත් ගැඹුරින් සාකච්ඡා කරනවා.

මේ වන විට ''ළමා ප්‍රදීපය'' පුවත් පතේ මැද පිටුවේ පළවුනු ''මත විමසුමට'' ගොඩක් අපේ දරුවෝ සම්බන්ධ වෙලා තිබෙනවා. අපේ දූ දරුවන් තමන්ට වඩාත් අවශ්‍ය වන දහම හා සම්බන්ධ කරුණු ගැන විවෘතව කථා කරන්න මේ මත විමසුම උපයෝගි කොට ගෙන තිබෙනවා. එය ඉතාමත්ම හොඳ පූර්වාදර්ශයක්. අපට ඉමහත් ශක්තියක් වුනේ ඔබේ විවෘත සම්බන්ධ වීමයි. ඉතින් ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපය'' පත්තරයක් හැටියට මුද්‍රණය වීම ආරම්භ කරල වසර පහක් ඉක්ම යන මේ කඩ ඉම් කාලය තුළ අපේම කතෝලික දූ දරුවන්ගේ පුවත් පත හැටියට ''ළමා ප්‍රදීපය'' අලුත් වෙලා ඊළඟ පාසල් වාරය ආරම්භ කරන විටම ඔබ අතට පත්වෙන කොට ඔබ එහි සැබෑම පාඨක දරු පරපුරක් වෙන බවනම් අපේ ඒකායන විශ්වාසයයි. මෙහිදී ඔබේ නවතම නිර්මාණ වලටත් වැඩි ඉඩ කඩක් ''ළමා ප්‍රදීපයෙන'' වෙන් වෙනවා. ඔබේ නිර්මාණ පුළුවන් තරම් ''ළමා ප්‍රදීපයට'' යොමු කරන්න ඔබ උත්සහ කළ යුතුයි. ඒ අතරම ඔබ ඉල්ලා සිටින විශේෂාංග උපරිමයෙන්ම ''ළමා ප්‍රදීපය'' තුළින් ගෙන එන්නටත් අපි උත්සහ දරනවා.

කතෝලික, පෞද්ගලික හා රජයේ පාසල් වල ඉගෙනුම ලබන දූ දරුවන්ටත් සහභාගි විය හැකි අන්දමින් විශේෂයෙන්ම ඒ ඒ පාසල් පිළිබඳව වෙනම විශේෂාංගත් ඉදිරියේදී ''ළමා ප්‍රදීපය'' පළ කරන්නට උත්සහ කරනවා. ඔබේ පාසල් ගුරුවරුන් ගැන දහම් පාසලේ ගුරුවරුන් ගැනත් කථා කරලා ඔවුන් අගයන්නටත් ''ළමා ප්‍රදීපයේ'' ඉඩක් ඉදිරියේදී වෙන්වෙනවා.

ඒ වගේම ආදර දුවේ පුතේ, අපේ ''මත විමසුම'' තුළ ඔබ ඉදිරිපත් කළ අයුරෙන්ම විවිධ වයස් කාණ්ඩ අනුව අදළ ලිපි විශේෂාංග රැගෙන එන්නත් ඉදිරියේදී ''ළමා ප්‍රදීපය'' කටයුතු කරනවා. දැනටමත් ''ළමා ප්‍රදීපය'' පත්තරය එකතු කරන ළමුන් බොහෝ දෙනෙක් ඉන්න බව අපිට දැන ගන්න ලැබුනා. ඉදිරියේදී ධර්මෝපදේශය හා ළමා ඥනෝපදේශය ඉතාමත්ම සරළව ''ළමා ප්‍රදීපය'' තුළින් ඉදිරිපත් වෙන නිසා ඔබට පුළුවන් ඒ සියල්ල එකතු කොට පොතක් සේ සකසා ගන්නත්.

සුදුවර චරිත කථා ගැන අපේ දූ දරුවන් ඉතාමත් වැඩි කැමැත්තක් දක්වන බව අපට ලියා එවා තිබෙනවා. කතෝලික දහමේ අපේ සම්ප්‍රදාය තුළ අපට මිනිස්කමත් දෙවීත්වයත් එකට සම්බන්ධ කරලා උත්තම මිනිස් දිවියේ සැබෑ හරය කියා දෙන මේ ශුද්ධවන්තයින් පිළිබඳව ඔබ හොඳකාරව දැන ගත යුතු නිසාමයි අපි ඒ විශේෂාංගය ඔබ වෙනුවෙන්ම ඉදිරිපත් කරන්නේ

ඉතින් ඔබේ සම්බන්ධතාවය හා සමීපතාවය ''ළමා ප්‍රදීපය'' සමඟ ඉතාමත් ලඟින්ම තිබෙන නිසා අපට තවත් එය විශාල ශක්තියක් වෙනවා. ඒ ශක්තිය තවත් ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වන්නේ ඔබේත් දායකත්වය මතයි. එම නිසා ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපය'' අලුත් වෙලා, අලුත් මුහුණු වරක් තුළ ඔබ අතට අලුත් පාසල් වාරයේදී පත් වෙන කොට ඔබ එහි නිත්‍ය පාඨක දරුවෙක් බව අමතක කරන්න එපා. ඉදිරි අනාගතයේදී මේ සිරිලක් දිව කතෝලික සභා මාතාවගේ දිදුලන ලේඛක ලේඛිකාවන් ලෙස පන්හිඳ ඔබ අත රැඳෙන්නේ අද ''ළමා ප්‍රදීපය'' තුළින් ඔබ ලබා ගන්නා උපරිම බලය තුළයි. එය මුදුන් පත් කරන්නට අපි සූදානම්. ඔබත් එයට සූදානම් බව අපි දන්නවා. අන්න ඒ ගමන යන්නටයි ''ළමා ප්‍රදීපය'' අලුත් වන්නේ.

**ඔබට ජේසු පිහිටයි**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ඔබටත් දේව කැඳවීමක්?



අද පූජක හෝ පැවිදි දිවිය ගත කරන බහුතරයකට එම ජීවිතයට අඩි තාලම වැටුනේ අද ඔබ ගත කරන ළමා අවධියේ බව නොරහසකි. එසේම එවැනි අදහසක් ජනිත වුණොත් තම පවුල් පරිසරයෙන් බව ද සත්‍යය වේ. පවුල තුළ දෙමාපියන් තම දරුවන් සමඟ පවුල් යාච්ඤාවේ යෙදෙන්නේ නම් එය ද දරුවන්ට දේව කැඳවීම් ඇති වීමට හේතුවකි. මෙවන් පසු බිමක් නොමැතිව හිටි අඩියේ දේව කැඳවීම් ඇති වීම බලාපොරොත්තු විය නොහැක්කකි.

ඔබට කිසියම් දිනක දේව කැඳවීමක හැඟීමක් ඇතිවුවහොත් වහාම කළ යුත්තේ තම දෙමාපියන්ට ඒ බව දැනුම් දීමය. අනතුරුව දෙමා පියන් මඟින් තමන් අයත් මීසමේ ගරු පියතුමාට දැනුම් දීම වඩාත් සුදුසුය. එතුමා ඔබව දිරිගැන්වීමට ඉඩ තිබෙනවා. එසේම ටික කලක් ඔබ පිළිබඳව විමසිල්ලෙන් සිටිනවා ඇත. ඔබ ඔබේ කැඳවීමේ හැඟීමේ දිගටම සිටින්නෙ හි නම් ගරු මීසම් සේවක පියතුමා ඔබව දේව කැඳවීම් පිළිබඳව පැවැත්වෙන කඳවුරකට සහභාගී කරනු ඇත. සමහර විට ඊට අමතරව තවත් දේව කැඳවීම් කඳවුරු වලට යොමු කිරීමට ගරු පියතුමා කටයුතු යොදනු ඇත.

ඉන් අනතුරුව ගරු පියතුමා දෙව්සත්හලට අයදුම්පත් යොමු කරන සමයේදී ඔබගේ දෙමාපියන් ද දැනුවත්ව අයදුම් පතක් යොමු කරනු ඇත. එහි සම්මුඛ පරීක්ෂණයෙන් ඔබ සමත් වුවහොත් ඉදිරි දිනකදී ඔබව දෙව්සත්හලට ඇතුලත් කර ගනු ඇත.

එහිදී ඔබේ දේව කැඳවීම තහවුරු කිරීම සඳහා සුදුසු අධ්‍යාපනයක් ලබා දීමට එහි අදියුරු පියතුමන් ඇතුළු ආචාර්ය මණ්ඩලය කටයුතු කරනු ඇත. අධ්‍යාපනයත්, ඔබේ යාච්ඤාවේ ජීවිතයත් දේව කැඳවීම සඳහා ඉදිරියට පියවර තැබීමට සුදුසුකමක් වනු ඇත. සමහර විට දීර්ඝ කාලයක් ඔබට දෙව්සත්හල් ජීවිතය ගත කිරීමට සිදු විය හැකිය. ඔබ තුළ ඇති අධිෂ්ඨානයත්, දේව කැමැත්තත් ඔබට අනාගතයේ පූජකවරයකු වීමට මඟ පාදනු ඇත.

ඔබ දැරියක් නම් ඔබටද පැවිදි සොහොයුරියක් වීමට කන්‍යාරාමයක පුහුණුව ලැබීමට සිදුවෙයි. පැවිදි සොයුරියක වීමද ගැහැනු දරුවකුට ලැබිය හැකි ඉතාම හොඳ දේව කැඳවීම කි. මෙහි මුලදී කිව් කරුනු ඔබටද අදළ වනු ඇත.

ආදර දුවේ පුතේ, ඔබට කැඳවීමක් ලබන්නට වාසනා මහිමයක් වේ නම් , එය දේවකැමැත්ත නම් එම හැඟීම ඇති වූදා සිට ඔබ යාච්ඤාව තුළින් එය සවිමත් කර ගත යුතුය.

**රාගම - ඩික්සන් ඇන්ටනි මාමා.**

**ඉදිරි සති දෙක තුළ 'ළමා ප්‍රදීපය' ඥනාර්ථ ප්‍රදීපයේ**

**ආදර දුවේ පුතේ, ඔබේ "මත විමසුමට" ඉඩක් දෙමින් පාසල් නිවාඩුකාලය තුළ සති දෙකක් "ළමා ප්‍රදීපය" ඥනාර්ථ ප්‍රදීපය හා සමඟ එකතු වෙන අතර නව පාසල් වාරය තුළ සිට "ළමා ප්‍රදීපය" අලුත් වෙමින් ඔබ අතට එනවා. දැන්ම ඔබේ කළාපය වෙන් කරවා ගන්න.**

සංස්කාරක පියතුමා

# මාරවිල මීසමේ දක්ෂ ලේඛකයෝ

## නොනිමි මව් සෙනෙහස



මහ මෙරක සෙනෙහසක් බඳුවූ අපේ අම්මා
රතු ලේ කිරි කර දුන් අපේ අම්මා
මා දස මසක් කුස තුළ හැදු අම්මා
අනේ ජේසුනේ රැක දෙන්න අපේ අම්මා

**නිපුණිකා මධුභාෂිණී සමරසිංහ**
09 ශ්‍රේණිය
සාන්ත පියුස් දහම් පාසල - හොරගොල්ල

## අම්මා

ඔබ සඳකි මගේ ලොව පහන් කළ
ඔබ ගඟකි මට ගලන්නට කියා දුන්
ඔබ ගසකි මට සෙවණ දුන්
ඔබ රැජිණකි මට ජීවිතය කියා දුන්

**ඔෂිනි මරීෂා ප්‍රනාන්දු** - 12 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - මාරවිල



## ජේසුගේ ආදර ළමයි

පුංචි ලස්සන මල් වගේ
ජේසුගේ ආදර දරුවො අපි
හැදෙමු වැඩෙමු අපි
යහගුණයෙන් ලොවට
වටින දූ දරුවන් සේ

**රමාලි ඇන්ජලා** - 07 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - මාරවිල



**රනීෂා වාස්**
10 ශ්‍රේණිය
සාන්ත මරියා
දහම් පාසල
මාරවිල



**දිස්නා පීරිස්**
06 ශ්‍රේණිය
සාන්ත මරියා
දහම් පාසල
මාරවිල

**වැඩමුළුවක ප්‍රතිඵලයක්**

## ජීවිත ගමන



**උදෑසන විකසිත වූ මල් මෙන් සැමදා**
**ප්‍රබෝධමත්ව සිට තම අනාගත අරමුණකරා**
**පියමන් කර සැබෑ ජීවිත ගමනක්**
**විවර කර ගැනීම අප හට**
**නව ජීවිතයක් උරුම කර දෙයි**
**කෙළෙසක හෝ තම ජීවිත ගමන**
**යථාර්ථවාදීව සැබෑ කර**
**ගතහොත් තම ජීවිතය අනාගතය**
**සඳහා සැබෑ කර ගත හැකිය.**

**මලීෂා ප්‍රියභාෂිණී පාරිස්**
08 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - මාරවිල

**මාසික සිතිවිල්ල**

**සේයා :-**
**ටෝනි නිශාන්ත**



**මාසික**
**සිතිවිල්ල**
"ජුලි මාසය"

ළමා ප්‍රදීපය, අංක 02, ,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# කන්ජුක්කුලිය මීසමේ දක්ෂ ලේඛකයෝ

## ජපමාලය අතට ගනිමු

චන්ගුමීත් යන්න ගියා
අභීත දියණියත් ගියා
පුංචි අපට දුක සිතුණා
වටිනා පැයක් ඉතුරු වුණා

සාතන්ව පළවා හරිමුද
ජපමාලය අතට ගනිමුද
ජේසු අම්මා හට යදිමුද
වැඩි හිටියනට අඬ ගසමුද



**රසිදු උදාන් මාලින**
06 ශ්‍රේණිය - සදාසරණ මාතා දහම් පාසල - රඹේපිටිය




## එළවළු නැන්දා

එළවළු නැන්ද දැන් එනවා
එළවළු වට්ටිය ගෙන එනවා
ගමේ හැමොම එතනට එනවා
එළවළු ගන්නට පොර කනවා

**කව්‍යා අමංජලී** - 06 ශ්‍රේණිය
සාන්ත බෙනඩික් දහම් පාසල - කන්ජුක්කුලිය



**අශේන් චමිදු**
10 ශ්‍රේණිය
කුඩාමඩු
දහම් පාසල
උඩයන්දළුව

## පුංචි කාලේ තනිවු මා



පුංචි කාලේ අඬද්දි කිරි
ඉල්ලා මම .....
ළඟපාතක කෙනෙක් නොමැත
ඇසෙන්නට එය
එකෙන් දෙකට පාස් වෙලා
ගෙදර ආපු මට
දැණුනා මට සුවඳ දිදී ගෙදර පුරාවට
අදයි අම්මේ දැක ගත්තේ පළමු වතාවට
සිතුනා මට තුරුළු කරන් ඔබෙන් අසන්නට
අදද අම්මේ කිරි එරුනේ එද අඩපුවට

**හිරුණි සමින්ද්‍යා ප්‍රියදර්ශණී**
09 ශ්‍රේණිය
සාන්ත බෙනඩික් දහම් පාසල - කන්ජුක්කුලිය

**කැලුම් රජන්ත**
09 ශ්‍රේණිය
**වික්ෂෝප දේව මාතා**
**දහම් පාසල**
**ඉලිප්පදෙනිය**



## මතුගම යොවුන් දූ පුතුන්ට විශේෂ දෙසුමක්

මතුගම මීසමේ දහම් පාසලේ 8 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා "යොවුන් වියට අභියෝගයක් වූ අද මාධ්‍ය" යන මැයෙන් විශේෂ දෙසුමක් 2013 අගෝස්තු මස 04 ඉරුදින දී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මතුගම මීසම් සේවක ගරු දෙව්ෂාන් අසංක පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

## ළමා ලේඛක වැඩමුළු

### හලාවත පදවිය



හලාවත පදවියේ ළමා ප්‍රදීපය පුවත් පත වැඩියෙන්ම අලෙවිවන පාසල වන දංකොටුව බාලිකා විදුහලේ (සුරදූතික නිකායට අයත්) සිසුවියන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 අගෝස්තු මස 01 වන දින පාසල් ශාලාවේදී පැවැත්වේ.

පාසලේ 8,9,10, යන ශ්‍රේණිවල ළමුන් සඳහා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව විදුහල්පති ගරු මේරි බර්නදෙත් පැවිදි සොහොයුරියගේ මඟපෙන්වීම යටතේ ගරු මේරි ඇනීටා පැවිදි සොහොයුරිය හා පාසලේ ආචාර්ය මඩුල්ලේ සහයෙන් මෙය සංවිධානය කරනු ලබයි.

**ඇන්ටන් ජේරාඩ් ප්‍රනාන්දු**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පූජාත්වරය

2009 /14

**4. පැවිදි ජීවිතය පිළිබඳ පාඩමේ සාකච්ඡාවේදී ළමුන්ගේ ප්‍රකාශන අතුරින් නිවැරදි වන්නේ.**

1. පැවදි වරයෙක් යනු ක්‍රිස්තුන් වහන්සේගේ සාක්ෂි කරුවකු ලෙස ජනතාවට සේවය කිරීම සඳහා කැපවූ කෙනෙකි.
2. පැවිදි වරයෙක් යනු ශ්‍රේෂ්ඨයින්ට කීකරුව ජීවත් වන්නෙකි
3. පැවිදි වරයෙක් යනු නිකාය තුළ සාංඝිකත්වය අත් දකින්නෙකි.
4. පැවිදි වරයෙක් යනු ඉහත සඳහන් සෑම කරුණක්ම පිළිපදින්නෙකි.

2009 /19

**5. නව ගිවිසුමේ අග්‍ර පූජකයා වනුයේ**

* ක්‍රිස්තුන් වහන්සේ

2009 /1/ii

**6. පූජකවරයේ සක්‍රමේන්තුව දානය කිරීමේ පිළිවෙත් තුළ දැකිය හැකි ප්‍රධාන අංග 2 ක් ලියන්න.**

* රදගුරු තුමා විසින් අපේක්ෂකයාගේ හිස මත අත් තබා යාච්ඤා කිරීම.
* රදගුරු තුමා විසින් ක්‍රිෂ්මා තෛලයෙන් (SC) අපේක්ෂකයාගේ දෑත් ආලේප කිරිම

2009 /04/i

**7. ජේසුස් වහන්සේ විසින් මහ බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කළ සක්‍රමේන්තු 2 කුමක්ද?**

* පූජාත්වරය
* දිව්‍ය සත්ප්‍රසාදය

2009 /04/iii

**8. නිල පූජකවරය තුළින් මීසම භාර පූජාප්‍රසාදි තුමාට මීසම තුළ ඉටු කිරිමට පැවරී ඇති කාර්ය භාර්යයන් 5 ක් විස්තර කරන්න.**

**පූජකවරය**

**නිල පූජකවරය**

**දිවැසි** — **පූජක** — **එඬේරික**

**දිවැසි**

* දේව රාජ්‍ය දේශනා කිරීම

**පූජක**

* දිව්‍ය පූජාව පැවැත්වීම
* ආශිර්වාදකාර බන්ධනය හා පූජාත්වරය භාර අනිකුත් සක්‍රමේන්තු දානය කිරීම
* ජනවන්දනාවේ මූලිකත්වය ගෙන කටයුතු කිරීම

**එඬේරික**

* කතෝලික එකමුතු කම ගොඩ නැගීම
* සැබෑ එඬේරකු වීම
* මීසමේ පවුල් බැහැදැකීම

2009 /07/04

**9. කෙටි සටහන් ලියන්න.**

පැවිදි ජීවිතය

* පූජකයින් ගැන කතා කිරීමේදී පදවි පූජක සහ පැවිදි පූජක යනුවෙන් කොටස් 2කි.

* පැවිදිවරයා පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨ පියතුමාගේ නැතහොත් ශ්‍රේෂ්ඨ මව්තුමියගේ අනුශාසකත්වය යටතේ ආධුනික පුහුණුවෙන් පසු දිළිඳු කම, ව්‍රතශුද්ධිය, කීකරුකම යන ව්‍රේදභාර ගනිමින් සාමූහික ජීවිතයක් තුළ තම කැපවීම දෙවිඳුන් ඉදිරියෙහි ප්‍රකාශ කරන්නෙකි.

* නි.ම.නි. ජේසු නිකාය යනුවෙන් පූජක පැවිදි නිකායන්ද ශු. පවුලේ නිකාය, යහපත් එඬේරාගේ නිකාය යනුවෙන් කාන්තා පැවිදි නිකායන්ද දක්නට ලැබේ.

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

# කෑගල්ලේ ළමා ලේඛක වැඩමුළුවක්



රත්නපුර පදවියට අයත් කෑගල්ල මීසමේ සාන්ත මරියා දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා පැවැත්වුණි. ළමුන්ගේ ලේඛන හැකියාවන් ඔප්නංවාලීමේ අරමුණින් පැවැත්වූ මෙය මීසම් සේවක ගරු මිල්ටන් වික්‍රමසිංහ පියතුමාගේ අනුශාසකත්වයෙන් මීසම් සහයක ගරු ශ්‍රේෂන් හපුආරච්චි පියතුමාගේ මග පෙන්වීම යටතේ දහම් පාසලේ ආචාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් සංවිධානය කෙරිණි.

මෙය මෙහෙයවුයේ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මෙම වැඩමුළුවේ සම්බන්ධීකරණ කටයුතු සිදුකළේ කෑගල්ලේ ප්‍රැන්සිස් පෙරේරා මහතාය. මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ. **නිර්මාලි මෙලනිකා ප්‍රනාන්දු**

# වැල්ලවාය දහම් ළමුන්ගෙන් ආදර්ශයක්.....



වැල්ලවාය ශා. මරියා දහම් පාසලේ ළමුන් මීසමේ වැඩිහිටි දිනයේදී වැඩිහිටියන් දෙපලක් ස්නානය කරවන අයුරු මෙහි දිස්වේ. මීසම් සේවක ගරු හේමන්ත පීරිස් පියතුමන්ගේ මග පෙන්වීම යටතේ මෙහි කටයුතු සංවිධානය කෙරිණි. **ශිකාන්ති ගුණවර්ධන - බදුල්ල**

# මොරටුව කන්‍යාරාමයේ දැරියෝ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය සමරති.

කිතුනු අප සැමගේ ජීවිතවල කේන්ද්‍රස්ථානය වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ළමුන්ගේ උතුම්වූ ගෞරවය හා නමස්කාරය පුද කරනුවස් දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය පසුගියදා මොරටුව ජයලත් අප ස්වාමිදූ සිසු දැරියෝ විදුහල් භූමියේදී ඉමහත් බැතියෙන් සැමරූහ.

ගරු ශිරාන් දසා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජාව පැවැත්වූ අතර පාසල් භූමිය වටා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පෙරහර ගමන් ගත්හ. ඉන් අනතුරුව දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයෙන් මෙහෙය අවසන කෙරිනි. මෙදින දිව්‍ය පූජාව හා පාසල් භූමිය අවට සැරසිලි කළේ පාසලේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය සංගමයේ හා ප්‍රැන්සිස්කාන දේව කැඳවීම් සංගමයේ සිසුවියන් විසිනි.

**ගරු චමිලා ප්‍රනාන්දු පැවිදි සොයුරිය**

# ශිෂ්‍ය නායක පුහුණු කඳවුරක්



කඳන සා. සෙබස්තියන් ප්‍රාථමික පිරිමි විදුහලේ 2013 ශිෂ්‍ය නායක නායිකාවන් සඳහා පුහුණු කඳවුරක් වැලිගම්පිටිය , වැලිකුරුඳුවත්ත මීසම් ශාලාවේදී පැවැත්වුණි. මෙදින ගීත භාවනා, ආධ්‍යාත්මික පෝෂණය හා රසවින්දනය වෙනුවෙන් විවිධ වැඩසටහන් ඉදිරිපත් කළේ විදුහල්පති ගරු සුදත් හේමන්ත පියතුමන් විසිනි. උස්වැටකෙයියාව ශු. පවුලේ කන්‍යාරාමයේ මනෝවිද්‍යා උපදේශිකා ගරු මොරින් සෙනෙවිරත්න පැවිදි සොයුරියද ළමුන්ගේ ස්වයං විනය , සාමූහික හැඟීමෙන් වැඩකිරීම, ස්ථානෝචිතව කටයුතු කිරීම පිළිබඳව ක්‍රියාකාරකම් ඇසුරින් ළමෝ පෝෂණය කළහ.

**විනී බර්ටි කිරිඇල්දෙනියගේ**
ආචාර්ය මඬුල්ල
සා. සෙබස්තියන් මහ විදුහල (ප්‍රාථමික අංශය)

(පැහැදිලි අකුරෙන් පුරවන්න)

නම :- ..............................................................
..............................................................

ලිපිනය :-
..............................................................
..............................................................

පාසල :-
..............................................................
..............................................................

ශ්‍රේණිය:- ..............................................................

උපන් දිනය :- ..................................................

මීසම / දහම් පාසල :- ......................................

..............................................................................

(වඩාත් උචිත පිළිතුර පැහැදිළිව දක්වන්න)

වයස් කාණ්ඩය :-
★ 7 - 12
★ 13 - 16
★ විවෘත

1. ළමා ප්‍රදීපය ඔබ කියවනවාද ?
ඔව් - නැත

2. ළමා ප්‍රදීපය කියවන්නේ
★ සතිපතා ★ අන් අයගෙන් ඉල්ලාගෙන
★ ලැබුණොත් ඉඳහිට ★ මිළදීගෙන

3. ළමා ප්‍රදීපයේ පළවන විශේෂාංග
ඔබේ කැමැත්ත අනුව 1,2,3 ලෙස වර්ග කරන්න.
(ඉදිරිපසින් අංකය සඳහන් කරන්න.)

★ කතු වැකිය
★ දහම් පාඩම
★ නිර්මාණ
★ කිතුනු උරුමය
★ සුදුවර චරිතය

# ළමා ප්‍රදීපය

ආදර දුවේ පුතේ,
හිතවත් ගුරුවරුනි, දෙමව්පියනි,

පුරා වසර පහක් තිස්සේ අඛණ්ඩව ආසියා
කතෝලික ළමා පුවත්පත සේ ළමා ප්‍රදීපය ඔබ අත
මත විමසුමක් තුළ තවත් වඩාත් ආකර්ශණීය පු
අතට ළමා ප්‍රදීපය පත් කරන්නට අප ගන්නා මේ
ගන්නට මේ ප්‍රශ්නාවලිය පුරවා නොපමාව පහත
ලිපිනයට යොමු කරන මෙන් ඉල්ලා සිටිමු. (සංස්කාර

★ ඉංග්‍රීසි පාඩම
★ ක්‍රිස්තියානි කලාව
★ කිතුනු කලා අසිරිය
★ පුංචි අපේ චිත්‍ර පිටුව
★ ප්‍රහේලිකාව
★ කළු සුදු චිත්‍ර කථාව
★ වර්ණ චිත්‍ර කථාව
★ පිපෙන මල්යාය (ළමා නිර්මාණ)
★ මුද්දර ලෝකය
★ කෙටිකතාව
★ ප්‍රවෘත්ති
★ මාසික සිතිවිල්ල
★ අපේ දහම් පාසල
★ දහම් ගුරු සිතුවිලි
★ ගුරු ඔවදනක්

- ළමා ප්‍රදීපය ධර්මෝපදේශය සඳහා අත්වැලක්ද?
ඔව් - නැත

4. ළමා ප්‍රදීපය ඔබ ලබාගන්නේ,
★ පල්ලියෙන් ★ දහම් පාසලෙන්
★ පාසලෙන් ★ වෙනත් (කුමක්දැයි දක්වන්න)

# මත විමසුම

වේ පළවන එකම
ට පත්වුනා. පොදු
ත් පතක් සේ ඔබ
ත්සහය සවිල කර
සඳහන් කර ඇති
ක පියතුමා)



5. ළමා ප්‍රදීපය පත්තරයේ ඔබ දකින අඩුපාඩු තුනක්

★

★

★

6. ළමා ප්‍රදීපය පත්තරයේ ඔබ දකින විශේෂතා තුනක්

★

★

★

7. ළමා ප්‍රදීපය පත්තරයෙන් ඔබ කියවීමට ආසා කරන අලුත් විශේෂාංග තුනක් නම් කරන්න.

★

★

★

8. ළමා ප්‍රදීපය අලෙවිය වැඩි කරන්නට කළයුතු දේවල් මොනවාද?

9. ඔබගේ අලුත් යෝජනා

10. ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත්පත වන ළමා ප්‍රදීපයේ පළවන එහෙත් අනවශ්‍යයැයි ඔබට සිතෙන දේවල්...

11 උසස් පෙළ සිසුවකු නම් ළමා ප්‍රදීපය ඔබට කෙතරම් වලදායිද? ඒ කෙසේද? නැතිනම් ඇයි ?

12. ඔබේ නිර්මාණ අතරින් වඩාත් කැමති අංගය (පිළිවෙලින් 1,2,3, ලෙස වර්ග කරන්න)
කෙටිකතා - කවි - රචනා - සිද්ධීන් - වාර්තා

13. ළමා ප්‍රදීපය ගැන ඔබ දැනගත්තේ කෙසේද?

දෙමාපියන් / වැඩිහිටියන් / ගුරු දෙගුරුන්ටද / සිය නම හා ලිපිනය සහිතව මේ ප්‍රශ්නාවලිය පුරවා පහත ලිපිනයට එවිය හැකිය.

ළමා ප්‍රදීපය මත විමසුම,
සංස්කාරක මණ්ඩලය,
කොළඹ කතෝලික මුද්‍රණාලය,
කොළඹ 08.
ලිපිනයට ජුලි 31 හෝ එදිනට පෙර එවන්න.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

**පාඩම් අංක : 104**

## අභ්‍යාසය

**01.** **Phrasal Verbs** කීපයක් පහතින් සඳහන් වෙනවා. ඒවා කාලයට සුදුසු විදිහට ගලපා (අතීත, වර්තමාන වශයෙන්) හිස් තැන් පුරවන්න.

- clear up - අහස වැනි දෙයක් පැහැදිලි වෙනවා.
- drop out - යමකට සහභාගි වීමෙන් ඉවත් වෙනවා.
- move in - යම් තැනකට අළුතින් එනවා.
- show off - තමන්ගෙ හැකියාවන් හුවා දක්වනවා.
- doze off - නිදි කිරා වැටෙනවා / තාවකාලිකව ටිකක් නිදාගන්නවා.
- close down - වසා දමනවා.
- Break down - කඩා වැටෙනවා / කැඩෙනවා
- Turn up - එනවා / සම්ප්‍රාප්ත වෙනවා.
- look out - බලාගෙන!
- take off - ගුවන් යානයක් අහසට නග්ගනවා.

1. I was very tired. I sat in an armchair and ................
මම හරි මහන්සියෙන් හිටියෙ. මම හාන්සි පුටුවකට වෙලා ටිකක් නිදාගත්තා./නින්දට වැටුනා.

2. I was late to school. Our school bus ..............
මට පාසලට පමා වුනා. අපේ පාසල් බසය කැඩුනා.

3. Sepalika took part in the singing competition. But she ............... after the 2nd round. සේපාලිකා ගායනා තරගයට ඉදිරිපත් වුණා. ඒත් ඇය දෙවන වටයට පස්සෙ නතර වුණා / අයින් වුණා.

4. The weather is very bad. It is raining heavily. I hope it will .......... later.
දේශගුණය හරිම නරකයි. තදින්ම වහිනවා. මං හිතනවා පස්සෙ ඒක හොඳ තත්වෙට එයි කියලා. (අහස පැහැදිලි වෙයි යන අදහස)

5. Kamala said she would come but she didn't..................
කමලා එනවා කිව්වා. ඒත් ආවෙ නෑ.

6. You bought a new house. Didn't you? when are you ..............?
ඔයා අලුත් ගෙයක් මිලදී ගත්ත නේද? කවදද ගෙට යන්නෙ?

7. We know that you are clever. your don't have to ..................
අපි දන්නවා ඔබ දක්ෂයි කියලා. ඒක පෙන්නන්න අවශ්‍ය නෑ.

8. The shop was running at a loss. So it .................. last month.
සාප්පුව පාඩුවට දුවමින් තිබුනෙ. ඒ නිසා ගිය මාසෙ ඒක වැහුව.

9. ..................there is a car coming. බලාගෙන! කාරෙකක් එනවා.

10. it was my first flight. I was scared when the plane .......
ඒක මගෙ පළමු ගුවන් ගමන. ගුවන් යානය අහසට නග්ගද්දි මට බය හිතුනා.

**02.** පහත සඳහන් වචන යුගලයන් යොදා හිස්තැන් පුරවන්න.

| | | |
|---|---|---|
| Keep up | on with | away with |
| back at | look at | |
| out of | forward to | |

1. you are walking too fast. I can't ............. with you.
ඔබ ඇවිදිනවා ඉක්මන් වැඩියි. මට ඔයා යන වේගෙන් යන්න බෑ.

2. I returned from my holiday. Next week I'll be ........work.
මම නිවාඩුව ඉවර වෙලා ආවා. ලබන සතියේ මම ආපහු වැඩට යනවා.

3. We have run ................. money. we have to collect some more.
අපිට මුදල් ඉවරයි. තව එකතු කරගත යුතුයි.

4. Keirthi is not happy in his job. because he doesn't get ............. his boss කීර්ති එච්චර සතුටින් නෙමේ රැකියාව කරන්නෙ. "බොස්" එක්ක එයා එච්චර හොඳ නෑ.

5. I love to ...........the stars in the night.
මම රෑට අහසේ තරු දිහා බලන්න ආසයි.

6. Are you looking .................. the party next week ?
ඔබ ලබන සතියෙ පාටිය ගැන බලාපොරොත්තුවෙන් ද ඉන්නෙ ?

7. There was a bank robbery last week. The robbers got .................2 million. ගිය සතියෙ බැංකු මංකොල්ලයක් සිදුවුනා. මංකොල්ලකරුවෝ රු. මිලියන 2 ක් අරන් පැනල ගිහින්.

# ක්‍රිස්තියානි කලාව හා වන්දනාව 25

# දේවස්ථාන ගොඩ නැඟීමේ කලාව

## ගෝත්‍රික ශෛලියේ රදගුරු දෙව්මැදුරු

මෙම යුගය ඇරඹෙන විට ක්‍රිස්තු භක්තිකයෝ වාසය කළ ප්‍රදේශ ''දියෝකිසි' යනුවෙන් හැඳින්වුන අඩවි වලට බෙදා තිබුණි. මෙම අඩවි වසම් වලට බෙද තිබුණි. (ලංකාවේ රෝමානු කතෝලික බැතිමතුන් අතර මෙම අඩවි 'පදවි' සේද මෙම වසම් 'මීසම් ' සේද නම් කරනු ලබන බවත් දක්නට ලැබේ) අඩවියේ පාලකයා 'බිෂොප්' හෙවත් 'රාජගුරුවරයා' නමින් හැඳින්වුනේය. වසම් පාලනය කරනු ලැබුණේ රාජගුරුවරයා යටතේ ක්‍රියාකළ සාමාන්‍ය පූජකවරුන් විසිනි.

හැම වසමකටම එම වසමේ ජනගහණයට ගැලපෙන ප්‍රමාණයේ කුඩා දේවස්ථානයක් විය. ඒවාට අමතරව හැම අඩවියකම රාජගුරුතුමාට අයත් වූ විශේෂ දෙව්මැදුරක්ද විය. අඩවියේ ලොකුම දේවස්ථානය වූ එය තුළ රාජගුරුවරයාගේ නිල ආසනය පිහිටා තිබුණි. එම නිසාම එය ''කැතීඩ්‍රල් දෙව්මැදුර'' හෙවත් ''ආසන දෙව්මැදුර '' නමින් හැඳින්වෙන්නට විය. මෙම ''කැතිඩ්‍රල් දෙව්මැදුර'' සිංහලෙන් ''රදගුරු දෙව්මැදුර''සේද හැඳින්විය හැක.

මධ්‍යකාලීන යුගය තුළ මෙම රදගුරු දෙව්මැදුර අති විශාල ලෙසද අති අලංකාර ලෙසද ඉදිකිරීමට ක්‍රිස්තුභක්තිකයෝ, රදගුරුවරුන්ගේ අනුබලය යටතේ විශාල පරිශ්‍රමයක් දැරූහ. එම රදගුරු දෙව්මැදුරුවලින් බොහෝමයක් අද දක්වා එයාකාරයෙන්ම ආරක්ෂාවී තිබේ. ශත වර්ෂ ගණනාවක් තුළ ඒවා එසේ ආරක්ෂා වී තිබීම පුදුමදයක්ද නොවේ.



ඒවා ගොඩනගන ලද්දේ සදා පවතිනු සඳහා ය. නූතන වාස්තු විද්‍යාඥයෝ ඒවාට වඩා විශාල ගොඩනැගිලි තනති. වඩා ඉක්මනටද තනති. එහෙත් ඒවාට වඩා ලස්සන ගොඩනැගිලි ඔවුන්ට නිපදවිය හැකිද යන්න සැක සහිත ය. එකලොස්වන හා දොලොස්වෙනි ශත වර්ෂවල ඉදිකැරුනු ඇතැම් දෙව්මැදුරු සඳහා එතෙක් සම්ප්‍රදායානුකූලව පැරණි රෝමානු ශෛලියම අනුමනය කරනු ලැබුණේය. එහෙත් මධ්‍යකාලීන යුගයට විශේෂ වූ නවාංගද එයට එකතු කරනු ලැබූ නිසා එම දෙව්මැදුරුවල ගොඩනැගිලි ක්‍රමය ''රෝමානු ක්‍රමය ' යනුවෙන් වෙනුවට ''රෝමනස්ක' ක්‍රමය යනුවෙන් හැඳින්වෙන්නට විය. සිංහලෙන් එම ''රෝමනස්ක ක්‍රමය'' ''මධ්‍යකාලීන රෝමානු ක්‍රමය'' සේද දැක්විය හැක.

මෙම නව ක්‍රමයේ විශේෂාංගය වූයේ අර්ධ වක්‍රකාර ආරුක්කු භාවිතය ය. එවැනි වටකුරු ආරුක්කු ඉතාමත් බහුලව දොරවල් හා ජනෙල් මත සවිකර තිබුණේය. මැදි ශාලාවේ කනු අතරටද යොදා තිබුණේය. බිත්තිවල පිටපැත්ත සැරසීමටද ඒවා භාවිත විය. එම දේවස්ථානවල වහලයද බොහෝවිට බෝක්කු මාර්ග යක වහල සේ අර්ධකවාකාර විය. විශාල වහලවල බර දරා ගැනීමට හැකිවන පරිදි බිත්ති හැකිතාක් ඝනලෙස ගලින් තනනු ලැබුණේය. බිත්තිවල සවිශක්තිය රැක ගැනීම සඳහා ජනෙල් ඉතාමත් කුඩා විය. බිත්තිවල ඝනකමද ජනෙල්වල කුඩාකමද නිසා මෙම ගොඩනැගිලි එක්තරා ගතියකින් යුක්තවන්නට විය.

දොලොස්වන සියවසේ අග භාගය වන විට දේවස්ථානවල මෙම බර ගතිය මඟ හැරවීමට අලුත්ම ගොඩනැගිලි ක්‍රමයක් ප්‍රංශයේ සොයාගනු ලැබුවේය. ''ගෝත්‍රික'' ගොඩනැගිලි ක්‍රමය සේ හැඳින්වෙන්නට වූ එය ඉතාමත් කඩිනමින් ප්‍රංශයෙන් පිටතද පැතිරෙන්නට විය. පිටස්තරයෙන් බැලුවිට එම ක්‍රමය තුළ වූ ප්‍රධාන වෙනස අර්ධ වක්‍රාකාර ආරුක්කු වෙනුවට මුදුනින් උල්වූ ආරුක්කු භාවිත වී තිබීමය. එහෙත් ඊට වඩා පෙරලිකාර දෙයක් එහි විය. නවතම ගොඩනැගිලි විද්‍යාවක් ඊට මුල්විය.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......



**ළමා මෙහෙකරුවන් නොවෙමු අපි**

උෂාන් පසිඳු
06 ශ්‍රේණිය
සා. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල
නාගොඩ,
කළුතර



**සැඳෑ අසිරිය**

නෙවිල් ප්‍රියන්ත ප්‍රනාන්දු - 05 ශ්‍රේණිය
ලූර්දු දේව මාතා දහම් පාසල - පොල්ගහවෙල

## පුංචි අපේ චිත්‍ර පිටුව

**ගොවීන් දෙදෙනෙක්**

කෙවින් නිවේෂ් තිසේරා
05 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් දහම් පාසල - කටුනේරිය



**පෙරහරක්**

හිමාන්ෂා නිකොලි
03 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා විදුහල
මීගමුව



චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**නියගය**

තිමිර රොනල්ඩ්
08 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
කෑගල්ල



**කඩමණ්ඩියක්**

ශෙවෝන් නිරූසාන්
06 ශ්‍රේණිය
ශාන්ත ජෝශප් දහම් පාසල
පමුණුගම




# ශු. හෙලේනා මුනිතුමිය



බ්‍රිතාන්‍යයේ ඉපදුන හෙල්නා රෝම අධිරාජ්‍යයේ හේවායෙක් වන කොන්ස්තන්තිනු ක්ලොරන්ස් සමග විවාහ විය. පසුව කොන්ස්තන්තිනු බටහිර යුරෝපයේ අධිරාජයා විය. දේශපාලන හේතුන් මත ඔහු හෙලේනාව දික් කසාද කළේය. නමුත් ඇගේ එකම පුතා වන තරුණ කොන්ස්තන්තිනු සිය මවට ඉතා පක්ෂපාතව සිටියේය.

ඔහු ක්‍රි.ව. 312 දී අධිරාජයා වූ විට ඔහුගේ මවට අසාමාන්‍ය ගෞරවයක් ලබා දෙන ලදී. කොන්ස්තන්තිනුගේ විශේෂ ජයග්‍රහණයට පසුව හෙලේනා ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්තාය. ඉතා විශ්වාසවන්ත බැතිමත් ක්‍රිස්තියානි කාරියක වශයෙන් මහත් ආදර්ශමත් වූවාය. ඇගේ ත්‍යාගශීලි බවත්, අධිරාජිනිය වශයෙන් මහත් බලයක් සත්‍ය විශ්වාසය පැතිරවීමට ඉමහත් හේතුවක් විය.

යුරෝපයේ බොහෝ දේවස්ථාන පිහිටුවූ පසු ඇය 75 වන වියේදී වන්දි ගෙවීමේ ගමනක් වශයෙන් ශු. දේශය වෙත ගියාය. මෙහිදී ඇය ජේසුස් වහන්සේ ඉපදුන ගුහාව ළඟ දේවස්ථානයක් ගොඩනැගුවාය. තවත් දේවස්ථානයක් අනෙක් පස කන්ද උඩ පිහිටු වන ලදී. හෙලේනා තුමිය ඇයට වසර 80 ක් වූ විට ජෙරුසලම කරා ගියාය.

ඇගේ එකම බලාපොරොත්තුව වූයේ අප ස්වාමින් වහන්සේ මරණයට පත්කළ ශු. කුරුසිය සොයා ගැනීමය. ඇය කල්වාරි කන්ද කැනීම් කරවන ලදී.

එවිට 'ඇයට කුරුස තුනක් හමු විය. ජේසුස් වහන්සේගේ කුරුසිය කුමක්දැයි ඇය නොදන්නීය. එක්තරා අසාධ්‍ය රෝගී කාන්තාවක් ශු. කුරුසිය ස්පර්ශ කළ සැනින්ම සම්පූර්ණ සුවය ලැබුවාය. මේ සිද්ධි යෙන් පසු ශු. කුරුසිය හෙලේනා තුමිය විසින් ඉතා ගෞරවයෙන් තබා ගත්තාය. පසු කලෙක ඇගේ පුත්‍රයා සතුරන් සමඟ යුද්ධ කරමින් සිටින විට ඔහුට තම මව විසින් ගෞරව කරනු ලබන ශු. කුරුසිය යහපත් වූ භාරයක් විය. එනම් මෙම යුද්ධයෙන් ජයග්‍රහණය කළ හැකි වුවොත්, ඔහු ක්‍රිස්තියානි ආගම වැළඳ ගන්නා බවය.

කොන්ස්තන්තිනු හට කුරුසිය ජයග්‍රහණයේ ලකුණක් ලෙස සැලකීමටද අණ කර සිටියේය. මෙම ශු. කුරුසියේ ඉතා සුළු කොටසක් සෑම අල්තාර ගලකම තැන්පත් කර ඇත. හෙලේනා තුමියගේ යාච්ඤාව හා ජීවිතාදර්ශය මගින් තම පුත්‍රයා දෙවි පියාණන් වහන්සේට දිනා දුන්නාය. ඇගේ මංගල්‍යය අගෝස්තු මස 18 වන දින දී පවත්වනු ලැබේ

**අසේල දසනායක විසිනි**



ප්‍රහේලිකා අංක 39

### හරහට

1. ක්‍රිස්තුන් වහන්සේට කුසගිනි වී මෙම ගසේ පල සොයාගොස් එහි කොළ පමණක් තිබෙනු දැක උන්වහන්සේ මෙම ගසට ශාප කළ සේක.

3. මෙසේ වූ බොහෝ දෙනෙක් ක්‍රිස්තුන් වහන්සේ සුව කළ සේක.

5. කිරිඳි පිළිබඳ උපමාවේ දී, ක්‍රිස්තුන් වහන්සේ දේව රාජ්‍යයට අයත් අයව මේවාට සමාන කරන ලදී.

6. ක්‍රිස්තුන් වහන්සේ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය සිදු කළේ කුඩා ළමයෙකු ලඟ තිබූ ..... රොටි පහද මසුන් දෙදෙනා ද ගෙන දෙවි පියාණන්ට තුති පුද දෙමිනි. මෙහි හිස් තැනට සුදුසු වචනය.

7. ''සිරුරට ....ඇසය එහෙයින් ඔබේ ඇස නිරෝගී නම්, ඔබේ මුළු සිරුර ආලෝකවත් වේ'' යැයි ක්‍රිස්තුන්වහන්සේ වදාළ සේක. හිස් තැනට සුදුසු වචනය.

### පහළට

1. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ උකුත් වූ පසු උන්වහන්සේගේ සිරුර ගෙන යාමට මෙම ජෝසෙප් පිලාත්ගෙන් අවසර ඉල්ලීය.

2. ''දරුවන්ගේ කෑම ගෙන බල්ලන්ට දැමීම සුදුසු නැතැ'' යි මෙම ස්ත්‍රිය තම දුවව සුව කර දෙන ලෙස ඉල්ලූ විට ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක.

3. ඔබේ මුඛය හරහා ...සහිත දොරක් දමන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. හිස් තැනට සුදුසු වචනය.

4. ඇදහිල්ල, බලාපොරොත්තුව හා ප්‍රේමය සඳහටම ....ධර්මතා තුනකි. මෙයින් ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමය බව ශු. පාවුළු තුමා පවසයි. හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ජුවාම් 6/1, 19/38, ශු. මතේව් 21/18 , 6/22, 15/21, 13/24 උපදේශකයා හෙවත් සිරාක් 28/25, 1 කොරෙන්ති 13/13)

සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 39, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

---

# ආදර ජේසුනී

**මගේ ජීවිතය නැමැති**
**ඔරුව තුළ ඇති, හබල,**
**ඔබ අත නේද?**
**එසේ නම් ජේසුනි ......**
**ගෙන යන්න මා**
**ඔබ කැමති තැනක,**
**එන්නම් මම ... ඔබට**
**අවැසි තැනට**
**පුරවන්න මේ හිස් බව**
**ඉඩ දෙන්නම් මම**
**පිරවෙන්නට ඔබගෙන්**
**ආදරෙයි මම හැමදාමත් ,**
**එසේ නම් .......**
**රැඳෙනවා නේද? මා අසලම**



**මිනුෂා ගයාත්‍රි -** ආචාර්ය මඩුල්ල
සා. අන්තෝනි දහම් පාසල- පහල කටුනේරිය
(කටුනේරිය මීසම )

# දරුවන් වෙනුවෙන් ජීවිත අධ්‍යාපනික වැඩමුළු ..

හලාවත පදවියේ කිතුනු දරුවන් තුළ ලිංගික අධ්‍යාපනය හා නුතන ජනමාධ්‍යය ගැන දැනුම්වත් කිරීමේ විශේෂිත වැඩසටහන් මාලාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. හලාවත පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත, ධර්මදූත අධ්‍යක්ෂ , ගරු නිශාන්ත ජානක, ළ.ක්‍රි.වී. අධ්‍යක්ෂ ගරු සිසිර කුමාර යන පියතුමන්ලාගේ අධීක්ෂණය යටතේ මෙය සංවිධානය කරනු ලබයි

මෙහිදි හලාවත පදවියට අයත් දිසාවන් හතරේ ළමුන් සඳහා විවිධ ස්ථානයන්හි සම්පත්දයකයින්ගේ සහභාගීත්වයෙන් සිංහල හා දමිල වැඩසටහන් 12 ක් ජුලි 27 වන සෙනසුරාදා දින සිට අගෝස්තු 28 වනදා දක්වා පැවැත්වෙන බැව් ගරු නිශාන්ත ජානක පියතුමා ළමා ප්‍රදීපයට පැවසීය.

**කුමර නයනජිත්**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
චිත්‍ර කථා රචනය ආනන්ද කාලිංගේරා
දෙබස් හා චිත්‍ර ඇස්. ඒ. පී. සමරආරච්චි
11
...එහෙම කෙනෙක් නම් අන්න අර ගෙදර ඉන්නවා...
එහෙම නම් වහාම ගිහිං.. ඒ ඇත්තියව මෙතනට කැඳවා ගෙන.. එන්න..
හොඳයි..
අම්මේ.. අම්මේ.. කුමාරි අපේ මල්ලියව අරගත්තා.. එයාට කිරි දෙන්න කිරි අම්ම කෙනෙක් හොයනවා..
..දුව මිරියම්..
කුමාරි මට කිව්වා කිරි දෙන්න කෙනෙක් හොයා දෙන්න... කියලා... මම කිව්වා මේ ගෙදර කිරි දෙන්න පුළුවන් කෙනෙක් ඉන්නව කියලා..
..ඉතිං.. ඉතිං..
කුමාරි කිව්වා අම්මව එක්ක එන්න කියලා...
හැබෑද.. එහෙනම් දෙවියෝ අපේ මූණ බැලුවා.. මගෙ දරුවගෙ වාසනාව... යමු.. යමු...
ඔබද අර පේන ගෙදර.. ඉන්නෙ..මේ දරුව කාවිරු හරි ගඟ දිගේ පාකරලා...එවලා.. ඔබට පුළුවන්ද මේ බිළිඳුව ගෙදර ගෙනගොස් හොඳින් බලාගන්න..
..පුළුවනං.. කුමාරි..
මේ බිළිඳුව හදාගන්ට යන සියළු වියදම් මම නුඹට දෙන්නම්.. මේ දරුවාව් හොඳින් බලා හදා හැනීමට... මම නුඹට.... හාර දෙනවා..
හොඳමයි..
හැබැයි එකක් මතක තියා.. ගන්න.. මා ස්නානයට යන විට.. හැමදාම මේ දරුවාව බලන්න.. එනවා... ..සේවිකාවෙනි..... ...අපි යමු..

**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ**
**කතාව**

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම —
ආමල් ද සිල්වා

**34**



1226 වසර පැමිණියා. ඒ ප්‍රැන්සිස්ගේ ජීවිතයේ 44 වන වසරයි. දේව කැමැත්ත පරිදි, ඒ ඔහු ස්වර්ගස්ථ වන වසරයි. තරුණ වියේදී, සුවිශේෂ අනුශාසනා අකුරටම පිළිපැද, දිළිඳුකම වැළඳගෙන කිසිදිනෙක ඉන් බැහැර නොවූ ප්‍රැන්සිස්, මරණය වැළඳ ගත්තේ ද දිළින්දකු මෙන් බිම වැතිර ගෙනය. කෙතරම් දුක් ගැහැට විඳින්නට සිදු වුවත් කවරදාත් දෙවිඳුන්ට තුති ගී ගැයූ ඔහු මරණයට මුහුණ පෑවේද ගී ගයමිනි.



මෙසේ ප්‍රැන්සිස්ගේ කෙටි ජීවිතය කෙළවරට පැමිණියා. එහෙත් ඒ ජීවිතයේ පණිවුඩය අදටත් නොනැසී පවතිනවා. මරණයෙන් දෙවසරකට පසු ඔහු ශුද්ධවරයට ඔසවනු ලැබුවා.

## සාමයේ යැදුම

ස්වාමිනී, මා ඔබගේ සාමයේ උපකරණයක් කළ මැනව. වෛරය ඇති තැන ප්‍රේමයත්, රිදවීම් ඇති තැන කමාවත්, සැකය ඇති තැන විශ්වාසයත්, බලාපොරොත්තු නැති තැන බලාපොරොත්තුවත්, දුක ඇති තැන ප්‍රීතියත්, අඳුර ඇති තැන ආලෝකයත්, මා මගින් පතුරුවනු ලැබේවා. දිව්‍ය ස්වාමිනි, සනසනු ලබන්නට වඩා සනසන්නට ද, තේරුම්ගනු ලබන්නට වඩා තේරුම් ගන්නට ද, ප්‍රේම කරනු ලබන්නට වඩා ප්‍රේම කරන්නට ද, මා වෑයම් කරන මෙන් සලසනු මැනව. මන්ද අප ලබන්නේ දීමෙන්ය. අප කමාව ලබන්නේ කමා කිරීමෙන්ය; අනන්තකාලික ජීවිතයට අප උපදින්නේ මරණයෙන් ය.

- අසීසියේ ප්‍රැන්සිස් මුනි -